**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර II - 2018**

**------------------------------------------------------------**

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ප්‍රථම ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2016 මාර්තු 17 දින එළඹි අංක එස්.එල්-පී 115 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 18 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම තුලින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩි කිරීමත්, එමඟින් ව්‍යාපෘති ප්‍රදේශයේ සෞඛ්‍ය තත්වය හා ජීවන පරිසරය වැඩි දියුණු කිරීම් වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 31,598 කට සමාන ජපාන යෙන් මිලියන 27,301 ක් සහ ඉන් රු.මිලියන 26,779 කට සමාන ජපාන යෙන් මිලියන 23,137 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 4,819 කට සමාන ජපාන යෙන් මිලියන 4,164 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘති සංදේශයට අනුව, ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන තුලින්, රු.මිලියන 22,464 කට සමාන ජපාන යෙන් මිලියන 19,409 ක ප්‍රමාණයක් ව්‍යාපෘති අදියර **II** යටතේ වූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට වෙන් කර තිබූ අතර ඉතිරි රු.මිලියන 4,315 කට සමාන ජපාන යෙන් මි. 3,728 ක් ව්‍යාපෘති අදියර I යටතේ වූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර තිබුණි. ව්‍යාපෘති අදියර **II** යටතේ වූ ක්‍රියාකාරකම් 2017 ජූනි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2024 මාර්තු වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018දෙසැම්බර් 31 දිනට මේ සමඟ වූ මූල්‍ය ප්‍රකාශයන් මඟින් මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 6 කින් සමන්විත වන අතර එයින් ව්‍යාපෘතියේ උපදේශක සේවා සංරචකය යටතේ වන කොන්ත්‍රාත්තුව පමණක් සමාලෝචන වර්ෂය තුළදී ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘති සංදේශයේ ක්‍රියාත්මක කිරීමේ කාලසටහනට අනුව තුළමුව, ජල පවිත්‍රාගාර, ජලාශ, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම් නල ඇතිරීම්හි ප්‍රධාන පද්ධති, බෙදාහැරීමේ උප පද්ධති සහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන පටිපාටියන් 2018 ජූලි මස වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2018 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර නොතිබුණි.